සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාරපරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
Second Term Test - 2018 | Grade 11

ව්‍යවසායකත්ව අධ්‍යයනය II | කාලය පැය 2
Enterprenaurship Studies II | Teo hours

- පළමු ප්‍රශ්න ඇතුළුව 5 කට පිළිතුරු සපයන්න.

01) පහත දි ඇති සිද්ධිය කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාසලේ දි ඉගෙන ගත් විෂයයන් අතරින් තොරතුරු තාක්ෂණයට ඉතා ප්‍රියතාවයක් දැක්වූ පුබුදු නිතරම විනෝදාංශයක් ලෙස ඒ පිළිබඳ දැනුම යාවත්කාලින කර ගැනිමට පෙළඹුණේය. මේ අතර ජාතික ආධුනිකත්ව මණ්ඩලය යටතේ තොරතුරු තාක්ෂණ පාඨමාලවක්ද හැදෑරූ ඔහු එම ලැබූ දැනුම නිවසේදි ස්වයං උත්සාහයෙන් හා අන්තර්ජාල තොරතුරු ඇසුරින් වඩාත් යාවත්කාලින කරගත්තේය. විනෝදාංශය තුළින් ඉස්මතු වූ මොහුගේ හැකියාව හදුනාගත් ඇතැම් පුද්ගලයන් හා ඇතැම් ආයතන තම තොරතුරු තාක්ෂණ අවශ්‍යතා මෙන්ම ඇතැම් පරිඝණක අළුත්වැඩියාවන්ද මොහු මගින් ඉටු කරවා ගන්නා ලදි. මෙසේ තැනින් තැනට ගොස් කාලයක් එම ව්‍යාපාර කටයුත්තෙහි යෙදුන පුබුදු නගරයට ආසන්නයේ කුඩා ගොඩනැගිල්ලක් මිලට ගෙන ව්‍යාපාර කටයුතු එහි ආරම්භ කිරිමට සැලසුම් කළේය. මෙහිදි අන්තර්ජාල සේවාවන් සැපයිම, පරිගණක මෘදුකාංග සැකසිම, පරිගණක අලුත්වැඩියාව හා අලෙවිය ඇතුළු සේවාවන් රැසක් ඉටු කරන සන්නිවේදන සේවා ආයතනයක් ලෙස එය ආරම්භ කිරිම ඔහුගේ අරමුණය.

පළමු පියවර ලෙස තමා රැස්කරගත් මුදල් යොදා අලෙවිය සදහා රජයේ කාර්යාලවල වෙන්දේසි වලින් හා කොළඹ නගරයේ ස්ථනයකින් අඩු මිලට පරිගණක කිහිපයක් මිලට ගන්නා ලදි. මේ අතර කොළඹදි හදුනාගත් පුද්ගලයකු මාර්ගයෙන් විදේශයකින් අඩු මිලට නව පරිගණක ගෙන්වා ගරනිමට ද පුබුදුට මග පැදි ඇත.

තම ව්‍යාපාරය දියුණු කර ගැන්මට දැඩි කැපවිමකින් කටයුතු කරන පුබුදු ඉහත කරුණු සියල්ල සලකා බලා මිලට ගනු ලබන ගොඩනැගිල්ල නවිකරණය කොට ''පුබුදු කොමියුනිකේෂන් '' නමින් කේවල ස්වාමි ව්‍යාපාරයක් ලෙස තම ව්‍යාපාරය ලියාපදිංචි කොට පවත්වාගෙන යාමට අපේක්ෂා කරයි.

i පුබුදුගේ ව්‍යාපාර අදහස් මුලාශ්‍රය කුමක්ද

ii පුබුදු තුළ දැකිය හැකි වූ ව්‍යවසායකත්ව ගුණාංග 04ක් දක්වන්න

iii පුබුදුට ව්‍යාපාර ස්ථානය නවිනරණය කිරිමට ප්‍රාග්ධනය සපයා ගත හැකි මුලාශ්‍ර 02ක් දක්වන්න.

iv ව්‍යාපාර ලියාපදිංචිය කිරිම සදහා බලපාන පනත හා ලියාපදිංචිය සිදු කරන ආයතනය කුමක්ද

v පුබුදුගේ ව්‍යාපාරයේ වාසි හා අවාසි 02 බැගින් ලියන්න

ව්‍යාපාරය නවීකරණය කිරීමට අදාළව පහත වියදම් දැරීමට සිදුවන බව ඔහු ඇස්තමේන්තු කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිල්ල මිළට ගැනීම | රු.800000 |
| පරිගණක හා පරිගණක මේස ඇතුළු කාර්යාල උපකරණ | රු.800000 |
| ලියාපදිංචි ගාස්තු | රු. 2000 |
| ව්‍යාපාර සැලැස්ම සැකසීම | රු. 10000 |
| දෛනික වියදම් | රු. 5000 |
| අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට හා දුරකථන ස්ථාපන ගාස්තු | රු. 30000 |

vi පුබුදුගේ ව්‍යාපාරයේ ස්ථාවර වත්කම් වටිනාකම කොපමණද

vii ආරම්භයට පෙර දැරීමට වන වියදම ගණනය කරන්න

viii කාරක ප්‍රාග්ධනය ගණනය කරන්න

ix ව්‍යාපාරය සඳහා අවශ්‍ය මුළු ආයෝජන ඇස්තමේන්තුව සකස් කරන්න

x පුබුදුගේ ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් 02ක් හා මුදල් ගලා යාම් 02ක් දක්වන්න

(ලකුණු 02×10=20)

02) i මිනිස් අවශ්‍යතා 02ක් දක්වා ඒ තුළින් පැන නගින වුවමනා 02ක බැගින් දකිවන්න

ii නූතන ව්‍යාපාර පරිසරය හා අතීත ව්‍යාපාර පරිසරය අතර ඇති වෙනස්කම් 02ක් දකිවන්න

iii පුද්ගලයකු තුළ නිර්මාණශිලිත්වය වර්ධනය කර ගැනීමට උපකාරි විය හැකි සාධක 04ක් දක්වන්න

iv නවෝත්පාදන එළි දැක්වෙන මූලාශ්‍ර 02ක් උදාහරණ සහිතව දක්වන්න

v ව්‍යාවසායකත්වය තුළින් දේශිය ආර්ථිකයට ලැබෙන ප්‍රයෝජන 04 ක් දක්වන්න

(ලකුණු 02×05=10)

03) i ව්‍යාපාර ආයතනයක **ශක්තීන්** ලෙස අදහස් කෙරෙන්නේ කුමක්ද? කුඩා ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් 02ක් දක්වන්න

ii ව්‍යවසායකයාට, ව්‍යවසායකත්ව කටයුතුවල යෙදීමෙන් කාර්යයන්හි විවිධත්වයක් ඇතිවේ. ඒ සඳහා උදාහරණ 02ක් දක්වන්න

iii ප්‍රධාන ව්‍යවසායකත්ව භූමිකා නම් කර ඉන් එක් භූමිකාවකට අයිති කාර්යභාරය දක්වන්න

iv ව්‍යවසායකත්ව භූමිකාව සාර්ථක වීමට බලපාන ප්‍රධන කුසලතා 04ක් දක්වන්න

v "ව්‍යාපාර පරිසරය" යන්නේන අදහස් කෙරෙන්නේ කුමක්ද? ව්‍යාපාර පරිසරය වර්ග කෙරෙන ප්‍රධාන ආකාර 02ක් නම් කරන්න

(ලකුණු 02×05=10)

04) i ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් වන සාධක 02ක් නම් කරන්න

ii ඔබගේ ප්‍රදේශයේ දැකිය හැකි පාරිසරික ගැටළුවක් දක්වා එයින් මතු කර ගත හැකි ව්‍යාපාරික අවස්ථාවක් දක්වන්න

iii පහත සදහන් උදාහරණ මගින් කුමන ව්‍යාපාර පරිසරයක් නියෝජනය කෙරෙන්නේද?

1-අන්තර්ජාතික ගිවිසුම්

2-බදු පැනවීම

3-වැඩිහිටි ජනගහනය ඉහළ යාම

4-ස්වාභාවික ආපදා

iv ශ්‍රී ලංකා ආර්ථිකයේ තෘතියික අංශය මගින් සිදුවන්නේ කුමක් දැයි හදුන්වා උදාහරණ 02ක් සපයන්න

v කෘෂිකර්මාන්තය තුළින් තව දුරටත් නිර්මාණය කර ගත හැකි ව්‍යාපාර අවස්ථා සදහා උදාහරණ 2ක් දක්වන්න

(ලකුණු 02×05=10)

05) i ව්‍යාපාරයක "ඉලක්ක පාරිභෝගිකයා" යනු කවරෙක්ද? පහත සදහන් භාණ්ඩ හා සේවා සදහා ඉලක්ක පාරිභෝගිකයා කවුරුන් දැයි දක්වන්න

1-දහම් පොත්පත්

2-සම පැහැපත් කෙරෙන ආලේපන

3-ක්‍රීඩා උපකරණ හා ඇදුම්

4-කාර්යයන් පහසු කරන මුළුතැන්ගෙයි උපකරණ

ii ව්‍යාපාර අදහස් හා අවස්ථා අතර වෙනස්කම් 02ක් දක්වන්න

iii හොද ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ 02ක් දක්වන්න

iv යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ පියවර දක්වා විශ්ලේෂණය සම්බන්ධයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න

v වර්තමානයේ බිහිවී ඇති ව්‍යාපාර සංවිධාන වර්ග 2ක් සදහා උදාහරණ සපයන්න

(ලකුණු 02×05=10)

06) i ව්‍යාවසායකයකුට නවෝත්පාදනයක් වෙනුවෙන් ලබා දෙන නෛතික ආවරණය කුමක්ද? එහි වලංගු කාලය කොපමණද?

ii හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කෙරෙන ආකාර මොනවාද? එම ආකාර අනුව ඒවාට අයත් වන ව්‍යාපාර සංවිධාන සදහා උදාහරණ දක්වන්න

iii කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර අතර සමානකම් හා වෙනස්කම් 02 බැගින් දක්වන්න

iv හවුල් ගිවිසුමක් මගින් හවුල්කරුවන් ඇති කර ගන්නා එකගතා සදහා උදාහරණ 4න් දක්වන්න

v සි/ස පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් පහත සදහන් කරුණු කුමන අන්දමින් ක්‍රියාත්මක වේද?

1-අදාළ වන පනත

2-සාමාජික සංඛ්‍යාව

3-කළමණාකරණය සිදුවන්නේ කා මගින්ද

4-නෛතික පුද්ගලභාවය

(ලකුණු 02×05=10)

07) i ව්‍යාපාර සැලැස්ම ඔබ නිර්වචනය කරන්නේ කෙසේද (ලකුණු 01)

ii ව්‍යාපාර සැලැස්මක මූලිකාංග 4ක් නම් කරන්න (ලකුණු 02)

iiiපුන්සර ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපාරයේ ඉදිරි වසර සඳහා ඇස්තමේන්තු ගත කර ඇති තොරතුරු පහත දක්වා ඇති

| | රු. |
|---|---|
| පුන්සර යොදවන මුදල | 1,000,000 |
| බැංකු ණය ගැනීම | 1200000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | 1500000 |
| ණයගැති ලැබීම | 800000 |
| සේවක වැටුප් | 250000 |
| විදුලි ගාස්තු | 15000 |
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | 500000 |
| තොග මිලදී ගැනීම | 1000000 |
| දුරකථන ගාස්තු | 28000 |
| ණය වාරික ගෙවීම | 112000 |

ඉහත තොරතුරු ඇසුරින්,

1-කාලඡේදය තුළ මුදල් ගලා ඒම් ගණනය කරන්න (ලකුණු 01)

2- කාලඡේදය තුළ මුදල් ගලා යාම් ගණනය කරන්න (ලකුණු 01)

3-කාලච්ඡේදය අවසානයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන්න. එමගින් මුදල් ශේෂය ගණනය කරන්න (ලකුණු 05)